# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | **මූල්‍ය බුද්ධි ඒකකය** |
| දිනය | **2024 ජූනි 26** |

**මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2024 ජනවාරි මස 01 වන දින සිට අප්‍රේල් මස 30 වන දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මූල්‍ය ආයතන සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම**

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19(1) සහ 19(2) වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව එම පනතේ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කරන ආයතන සඳහා මූල්‍යමය දණ්ඩන පනවනු ලැබේ. අදාල අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බරපතලකම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කළ හැකිය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතනවල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2024 ජනවාරි මස 01 වන දින සිට අප්‍රේල් මස 30 වන දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පහත දක්වා ඇති පරිදි එකතු කරගන්නා ලද සමස්ත දඩ මුදල රුපියල් මිලියන තුනකි. එලෙස දණ්ඩන මගින් එකතු කරගන්නා ලද මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි.

**1. ඩී. එෆ්. සී. සී. බැංකුව**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2024 මාර්තු 07

**වටිනාකම** : රු. 1,000,000.00 (රුපියල් මිලියනයකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2024 මාර්තු 26

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි අවශ්‍යතාවන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදි.

i. 2021 අංක 18 දරන මුදල් පනත යටතේ සිදු කරන ලද තැන්පතු සඳහා චක්‍රලේඛ අංක 04/21 සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන් මගින් නියම කර ඇති පරිදි ගනුදෙනුකරුවකුගේ අරමුදල්/ ඉපයුම්වල මූලාශ්‍රයන් පිළිබඳ තොරතුරු ලබාගැනීමේ අවශ්‍යතාවය ඇතුලුව එම ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනීමට බැංකුව අපොහොසත් විය. ගිණුමට බැර කර ඇති මුදල, ගිණුම් විවෘත කිරීමේ අයදුම්පතේ සඳහන් පරිදි ආදායම් ලැබෙන මූලාශ්‍ර වලින් පාරිභෝගිකයාගේ අපේක්ෂිත පිරිවැටුමට නොගැලපෙන බව නිරීක්ෂණය විය.

ii. ගිණුම් විවෘත කිරීමේ අයදුම්පතේ දක්වා ඇති පරිදි එකී ගනුදෙනුකරුගේ ස්ථිර ලිපිනය, ගිණුම විවෘත කරන ලද ශාඛාවට දුරස්ථව පිහිටීම සම්බන්ධව පිළිගත හැකි සහ වලංගු හේතුවක් ඉදිරිපත් කිරීමට බැංකුව අපොහොසත් විය.

iii. එකී ගනුදෙනුකරුගේ ගනුදෙනු වලට අදාළ සැක කටයුතු ක්‍රියාකරකම් හඳුනා ගැනීමට මෙන්ම ඔහු සම්බන්ධයෙන් සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ගොනු කිරීමට ද බැංකුව අපොහොසත් විය.

**2. සම්පත් බැංකුව**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2024 මාර්තු 28

**වටිනාකම** : රු. 2,000,000.00 (රුපියල් මිලියන දෙකකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2024 අප්‍රේල් 24

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි අවශ්‍යතාවන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදි.

i. බැංකුව විසින්, ගිණුම් හිමියා හඳුනාගත නොහැකි වූ ගිණුම් විවෘත කර පවත්වාගෙන යනු ලැබූ අතර එම ගිණුම් හිමියන්ගේ තොරතුරු අදාල ගිණුම් හා සම්බන්ධ කර නොමැති බැවින් ජාතික හැඳුනුම්පත් අංක වැනි හඳුනාගැනීමේ දත්ත උපයෝගී කරගනිමින් මෙම ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාරික සබඳතා මූලික බැංකු පද්ධතිය තුළ සොයා ගැනීමට නොහැකි විය.

ii. එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ආරක්ෂක මණ්ඩලයේ සම්මත වූ යෝජනා අංක 1373 ට අනුව 2012 අංක 01 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි ඇතුලත් අංක 4(7) දරන නියෝගය යටතේ 2019 මැයි 23 දිනැති අංක 2124/32 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත නම් කරන ලද තැනැත්තෙකු සමග ව්‍යාපාරික සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම.

iii. 2012 අංක 01 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි ඇතුලත් අංක 05 දරන නියෝගයට සහ නිසි බලධාරියා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2014 මැයි 22 දිනැති අංක 1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයට අනුව, එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ආරක්ෂක මණ්ඩලයේ සම්මත වූ යෝජනා අංක 1373 යටතේ නම් කරන ලද තැනැත්තන්ගේ අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ප්‍රමාදයකින් තොරව අත්හිටුවීමට අපොහොසත් වීම.

iv. මූල්‍ය බුද්ධි ඒකකය විසින් සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලද 'මූල්‍ය බුද්ධි ඒකකය/එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ආරක්ෂක මණ්ඩලයේ සම්මත යෝජනා අංක 1373/විධාන අංක 1' (FIU/ UNSCR-1373/ Directives No. 1) හි අවශ්‍යතාවන්ට අනුව නම් කරන ලද තැනැත්තන් සතු අරමුදල්, අනෙකුත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් පිළිබඳ සම්පූර්ණ තොරතුරු නොපමාව මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දීමට අපොහොසත් වීම.